**මැදගම ප්‍රාදේශීය සභාව**
**මොණරාගල දිස්ත්‍රික්කය**
**--------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 23 වැනි දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 12 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 අගෝස්තු 27 වන දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 **මතය**

මගේ වාර්තාවේ දක්වා ඇති දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට මැදගම ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

1.3.1 **ශුද්ධ වත්කම්වල අඩු වීම**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ශුද්ධ වත්කම්වල අඩු වීම රු.49,391,081ක් විය.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු රු. 16,220 ක වියදම් වෙනුවෙන් ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) ඉන්ධන හා ජලය ලබා ගැනීමට ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් තැන්පත් කර තිබූ රු.72,500ක් සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොකර ආයෝජන යටතේ ගිණුම් ගත කර තිබුණි.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.34,513,413ක වත්කම් විෂයන් 02 ක් හා රු.18,622,635 ක වගකීම් විෂයක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 **නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි විධි විධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති,රීති රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | |
| (i). 19 (1) (1)වගන්තිය | පළාත් පාලන කොමසාරිස්ගේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව කම්කරු තනතුරු සඳහා පුද්ගලයන් දෙදෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී රු.114,290ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ii). 132 (ඒ) හා (ඕ) වගන්තිය | සභාව විසින් විවිධ කාර්යයන් සහ ඉදිකිරීම් වෙනුවෙන් සභා අරමුදලින් රු.300,810ක් වැයකර තිබුණද අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| iii. 158 හා 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.1,962,415 ක හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,981,372ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,497,810 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 පළාත් සභා ප්‍රතිපාදන යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් මැදගම නගරයේ ඉදිකර තිබූ දෙමහල් ගොඩනැගිල්ලේ කඩ කාමර 05ක් දින රහිතව සභාවට භාර දී තිබුණද, විගණන දිනය වූ 2014 පෙබරවාරි 28 දින වන විටත් බදු නොදීම නිසා සමාලෝචිත වර්ෂයේ රු.408,600 ක තක්සේරු ආදායමක් අහිමි වී තිබුණි.

2.2.2 <u>බදුකුලී</u>

සභාව සතු සතිපොළ, මිරිදිය මාළු වෙළඳසැල හා අංක 01 හා අංක 02 මුහුදු මාළු වෙළඳසැලෙහි බදු ගිවිසුමේ 03 වන වගන්තිය ප්‍රකාරව නියමිත බදු වාරිකය ඒ ඒ මාසයේ අවසාන දිනයේ හෝ එදිනට පෙර සභාවට ගෙවිය යුතු වුවත් එසේ සිදුකර නොතිබූ බදුකරුවන්ගෙන් ප්‍රමාද ගාස්තු රු.289,282ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනිකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | <u>රු.</u> |
|---|---|
| උසාවි දඩ | 873,382 |
| මුද්දර ගාස්තු | 380,149 |

2.3 <u>අධිභාර</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවළුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුලදී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.43,923 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

2.4 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

බකිණිගහවෙල කීනගොඩ කණිටු විද්‍යාලයට ජලය ලබාදීම සඳහා සමාලෝචිත වර්ෂයේදී පළාත් විෂය නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.60,000ක ප්‍රතිපාදන මුදලක් වෙන් කර තිබුණි. විද්‍යාලයේ පාසැල් සංවර්ධන සමිතියට මෙම කර්මාන්තය භාරගෙන ඉදිකිරීම කරන ලෙස 2013 අප්‍රේල් 18 දින දන්වා තිබුණ ද පාසල් සංවර්ධන සමිතිය මඟින් මෙම ඉදිකිරීම කළ නොහැකි බව දන්වා තිබුණි. එහෙත්

ප්‍රදේශයේ වෙනත් ලියාපදිංචි ස්වේච්ඡා සංවිධානයක් මඟින් ඉටු කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.5 **සන අපද්‍රව්‍ය කළමණාකරණය**

මැදගම ප්‍රාදේශීය සභාව මඟින් විවිධ ආයතනයන්ගෙන් ලැබූ ආධාර මත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2005 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා රු.3,765,979ක් වියදම් කර තිබුණි. කොම්පෝස්ට් පොහොර සෑදිමට සුදුසු අපද්‍රව්‍ය.එකතු නොවීමේ හේතුවෙන් කොම්පෝස්ට් පොහොර සෑදීමේ ව්‍යාපෘතිය නවතා තිබූ බව 2014 පෙබරවාරි 24 දින කරන ලද භෞතික පරික්ෂාවේදි අනාවරණය විය.

2.6. **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් හා වර්ෂයේ තථ්‍ය ආදායම්, වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර පාලනය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය